# 2557 වන වෙසක් උළෙලට සමෘද්ධි බැංකු සංගම්හි සහභාගිත්වය

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරනු ලබන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 20 ට හත්වන එකතුව**

1. පාලක මණ්ඩලය,
   සමෘද්ධි බැංකු සංගමය, ................................
2. කළමනාකරු,
   සමෘද්ධි බැංකු සංගමය, ................................
3. සභාපති, විධායක කමිටුව,
   සමෘද්ධි මහ සංගමය, ..............................
4. කළමනාකාර අධ්‍යක්ෂ,
   සමෘද්ධි මහ සංගමය, .........................................
5. මූලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, .........................................
6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, .......................................
7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, .......................................
8. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, .......................................
9. අභ්‍යන්තර විගණක, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
10. සාමාන්‍යාධිකාරී සහ සියළුම අධ්‍යක්ෂවරු, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
11. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, 5 වන මහල,
    අංක 464, ටී.බී. ජායා මාවත, කොළඹ 10.


**බැංකු මූල්‍ය කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,**

**4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**


**2012.05.02**


දුරකථන අංකය :- 0112 - 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2012.05.02

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරනු ලබන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 20 ට හත්වන එකතුව**

# <u>2557 වන වෙසක් උළෙලට සමෘද්ධි බැංකු සංගම්හි සහභාගිත්වය</u>

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මගින් ක්‍රියාවට නංවන අධ්‍යාත්මික හා සාරධර්ම පිරි සමෘද්ධිමත් ගමක් නිර්මාණය කිරීමේ උදාර කර්තව්‍යයට උරදෙමින් සැම වසරකම වෙසක් පොහෝ දිනය නිමිති කරගෙන සිදු කරන දීප ව්‍යාප්ත වෙසක් වැඩසටහන මෙවර ද මහ සංගම් හා බැංකු සංගම් හරහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ, ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා, අමාත්‍යාංශ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ හා සමෘද්ධි වැඩසටහනේ කාර්ය මණ්ඩලයෙන් ලබාදෙනු සහාය ඉතා අගය කල යුතුය.

දිවිනැගුම වැඩසටහන සඳහා සමෘද්ධි ශක්තිය ලබාදීමේ අරමුණෙන් සමෘද්ධි බැංකු සංගම් මගින් අවශ්‍ය කටයුතු සම්පාදනයට මේ වනවිට සිදු කරමින් සිටී.

ඒ අනුව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් මේ සම්බන්ධව නිකුත් කරන ලද බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 20 ට ඊට අදාල එකතුන් පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් මින් උපදෙස් ලබාදෙනු ලැබේ.

## 1. "බුදුසරණ" වෙසක් කලාපය ධර්ම දානයක් ලෙස නොමිලේ බෙදාහැරීම.

1.1 පසුගිය වසරේ මෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මට්ටමින් බුදුසරණ පුවත්පත් බෙදාහැරිමට ලේක්හවුස් ආයතනය එකඟ වී ඇත. ඒ අනුව 2013 මැයි 17 දින සිට 2013 මැයි මස 21 වන දින වනවිට අදාල පුවත්පත් බෙදාහැරීමේ කාර්යය අවසන් වනු ඇත. මෙම කාලය තුල කුමන හෝ වේලාවක ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ලැබෙන පුවත්පත් නිසි පරිදි ලිඛිතව භාර ගැනීම හා සමෘද්ධි බැංකු සංගම් වෙත ලබාදීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගැනීම මහ සංගම් කළමනාකාර අධ්‍යක්ෂගේ/ මූලස්ථාන සමෘද්ධි කළමනාකරුගේ වගකීමක්වේ. එසේම අදාල පුවත් පත් සමෘද්ධි අංශය වෙත පමණක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ගන්නා ලෙස දන්වමි.

1.2 දිස්ත්‍රික්කයේ සුවිශේෂ ආගමික ස්ථානයක "ධර්මදානයක්" ලෙස බෙදාහැරිම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අංශය වෙත මෙවරද නොමිලේ "බුදුසරණ" පුවත්පත් ප්‍රමාණයක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව එම පුවත්පත් ද ඉහත සඳහන් දිනවලදි ලේක්හවුස් ආයතනය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබාදීමට කටයුතු කරන බැවින් එම පුවත්පත් නිසි ලෙස භාරගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කරගැනීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමු.

මෙම සුවිශේෂී වැඩසටහන පිළිබඳව හා මහ සංගම්, බැංකු සංගම් මගින් සිදුකරනු ලබන වැඩසටහන් පිළිබඳ කෙටි වාර්තාවක් පහත සඳහන් ආකෘතිය අනුව බැංකු මූල්‍ය කටයුතු අංශය වෙත 2013.06.15 දිනට පෙර එවීමට කටයුතු කළ යුතුවේ.

දිස්ත්‍රික්කය ...........................

| | බැංකු සංගමය/මහ සංගමය නම | පැවැත්වූ ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව | බෙදාහල පුවත් පත් සංඛ්‍යාව | සහභාගි වූ ධර්ම දේශකයානන් හා දේශපාලන අධිකාරිය | වෙනත් |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් සුවිශේෂි වැඩසටහන | - | | | | | |
| මහ සංගම් වැඩසටහන | | | | | | |
| බැංකු සංගම් වැඩසටහන | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

1.3 බුදුසරණ පුවත්පත් බෙදාහැරීමේ කටයුතු 2013 මැයි මස 21 වැනි දින වනවිට අවසන් කිරීමට ලේක්හවුස් ආයතනය එකගත්වය පළ කර ඇති බැවින්, එදින වනවිටත් බුදුසරණ පුවත්පත් නොලැබී ඇත්නම් හෝ වෙනත් ගැටළුකාරි තත්ත්වයක් ඇති වුවහොත් ඒ සම්බන්ධව විමසා බැලීමට ලේක්හවුස් ආයතනයේ බෙදාහැරීමේ කළමනාකරු රොබට්සන් මහතා දුරකථන අංක 077-3675256 මගින් අමතන මෙන් දන්වා සිටිමු.

**1.4** <u>**කළමනාකාර අධ්‍යක්ෂ/ මුලස්ථාන කළමනාකරු/ සමෘද්ධි බැංකු සංගම් කළමනාකරුගේ විශේෂ අවධානයට**</u>.

වර්තමානයේ බුදුසරණ පුවත්පතක මිල රු. 30/- ක් වේ.

1.5 ඒ අනුව සමෘද්ධි බැංකු සංගම් පොදු ලෙජරයේ කේත අංක 2130 "වැය ගිණුම පුවත්පත් ගිණුම හර කර බැංකු සංගමය මිලදී ගැනීමට අපේක්ෂා කරන පුවත්පත් සඳහා " යන වියදමට අදාල චෙක්පත මෙම චක්‍රලේඛය ලද විගසම තම මහ සංගමය වෙත යැවිය යුතුය. (පුවත්පත් 300 මිලට ගන්නේ නම් (රු. 30/- x 300) වියදම් රු. 9000/- කි.)

1.6 මෙලෙස "බුදුසරණ" පුවත්පත් සඳහා බැංකු සංගම් මගින් මහ සංගමයට ලැබෙන චෙක්පත් ජංගම ගිණුම හර කර මහ සංගමයේ පොදු ලෙජරයේ " සමෘද්ධි බැංකු සංගම් වලින් රැස් කර සමෘද්ධි අධිකාරියට ප්‍රේෂණය කළ යුතු අරමුදල් ගිණුමට" බැර කළ යුතුය.

1.7 බැංකු සංගම් මගින් ලැබෙන චෙක්පත මහ සංගමයේ ජංගම ගිණුමට තැන්පත් කළ වහාම මහ සංගම් බල ප්‍රදේශයට අයත් සියළුම බැංකු සංගම්වලට බුදුසරණ පුවත්පත් මිලදී ගැනීමට අදාල මුළු මුදල් ප්‍රමාණය, " කළමනාකරු, ලංකා බැංකුව, බත්තරමුල්ල ජංගම ගිණුම් අංක 3417925 බැංකු මුලා කටයුතු අංශයේ ආයෝජනය ගිණුමට" බැර වනසේ චෙක්පතකින් 2013.05.20 දිනට පෙර පහත සඳහන් ආකෘතිය ද සමග අධ්‍යක්ෂ බැංකු මුලා කටයුතු වෙත එවිය යුතුවේ. ( මහ සංගමයට අදාල සියළුම බැංකු සංගම් සමග සම්බන්ධිකරණය වෙමින් පුවත්පත්වලට අදාල මුදල් නියමිත දිනට අධිකාරියට එවීමේ වගකීම කළමනාකාර අධ්‍යක්ෂ වෙත පැවරේ.)

**දිස්ත්‍රික්කය :-**

| මහ සංගමයේ නම හා දුරකථන අංකය | බැංකු සංගමයේ නම | මිලදී ගත් පිටපත් ගණන | මහ සංගමය මගින් අධිකාරිය වෙත එවනු ලබන චෙක්පත්හි අංකය හා බැංකු ශාඛාව | බැංකු සංගම් මගින් සිදු කරන ලබන වැඩසටහන පවත්වනු ලබන විහාරස්ථානය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

* අදාල චෙක්පත් එවීම සම්බන්ධව පවත්වා ගත යුතු රෙජිස්තරය හා ලෙජරයන්හි මීට අදාල සටහන් ලබාදී ඇති උපදෙස් පරිදි තැබිය යුතුවේ.

## 2. සමෘද්ධි බැංකු සංගම්හි ක්‍රියාත්මක වැඩසටහන.

2.1 "බුදුසරණ" වෙසක් කලාපය ධර්ම දානයක් ලෙස බෙදාහැරීම.

2.2 වෙසක් පුන් පොහෝදා ධර්ම දේශනාව/අධ්‍යාත්මික වැඩසටහන්.

2.3 පහන් කුඩු තරගය/ භක්ති ගීත ගායනා.

මෙම වැඩසටහන් පසුගිය වසරවල ලබාදී ඇති උපදෙස් පරිදි සිදු කළ යුතුවේ.

## 3. සමෘද්ධි මහ සංගම්හි ක්‍රියාත්මක වැඩසටහන්.

3.1 පසුගිය වසරේ මහ සංගම් මගින් ක්‍රියාත්මක කළ බුද්ධ පූජාවක් සහ විශේෂ ධර්ම දේශනා වැඩසටහන, මහ සංගම් කාර්යාල පරිශ්‍රයේ වෙසක් කුඩු හා පහන් වැටි වැනි සම්ප්‍රදායික ක්‍රම මගින් ඒකාලෝක කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදෙන අතර, පසුගිය වසරේ මෙන්ම බැනර් හා ධජ, පතාක ප්‍රදර්ශනයට කටයුතු කළ යුතුවේ. බැනරය ප්‍රදර්ශනය හා මහ සංගම් මගින් සිදු කරන ලබන වැඩසටහනේදි රටට, අතිගරු ජනාධිපතිතුමාට, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා ඇතුළු සැමට සෙත් පැතීමට හා ආශිර්වාද කිරීම ද ඇතුළුව අදාල වැඩසටහන් සංවිධානය කිරීම සිදු කළ යුතු අතර, ඊට අදාල බැනර් ද ප්‍රදර්ශනය කළ යුතුවේ. පසුගිය වසරේ සකස් කළ බැනරයන් මහ සංගම් සතුව පවති නම් එම බැනර නිසි පරිදි සකසා ප්‍රදර්ශනය කිරීම මහ සංගම්හි වැය බර අඩුකරලීමට හේතුවේ.

පසුගිය වසරේ භාවිතා කළ ඉහතින් දැක්වූ සෙත් පැතිමේ හා ආශිර්වාද කිරීමට අදාල බැනරය,සැරසිලි මෙම වසරේ භාවිතයට ගත නොහැකි මට්ටමේ පවති නම් ඒ සඳහා රු. 1.500/- ක උපරිමයකට යටත්ව මහ සංගම් අරමුදලින් දැරීමට මින් අනුමැතිය ලබාදෙමු.

3.2 ඊට අමතරව මහ සංගම් මගින් ක්‍රියාත්මක කරන ආගමික වැඩසටහන සඳහා රු. 5,000/- ක සීමාවක් යටතේ වැය දැරීමට අනුමැතිය ලබාදෙමු.

3.3 මහ සංගම්, බැංකු සංගම් මගින් සිදු කරනු ලබන වෙසක් උත්සව වැඩසටහන තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් එක් ප්‍රධාන උත්සවයක් සංවිධානය කර ඒ සඳහා ප්‍රදේශයේ ගරුතර සංඝරත්නය, ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපති ඇතුළු මහජන නියෝජිතයින්, ප්‍රභූවරුන්,සමෘද්ධි/දිවි නැගුම වැඩසටහන් ක්‍රියාකාරීන් දැනුවත් කර ඒ සඳහා ඔවුන්ගේ කාරුණික සහභාගිත්වය ලබාදෙන මෙන් දැනුවත් කරන්න.

මෙම දැනුවත් කිරිමේ ලිපිය තුල බුදුසරණ වෙසක් කලාපය ධර්ම දානයක් ලෙස නොමිලේ බෙදාහැරිම, සමෘද්ධි බැංකු සංගම්, මහ සංගම් මගින් සිදු කරන ලබන වැඩසටහන පිළිබද කෙටි හැදින්වීමක් සුදුසු පරිදි සිදු කරන්න. මෙම වැඩසටහන අවසන් වූ වහාම මහ සංගම් හා බැංකු සංගම් වලට අදාල වාර්තාවන්ඡේද 1.2 හි සඳහන් ආකෘතියට අනුව දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය වෙත කඩිනමින් ලබාදීමට කටයුතු කරන්න. දිස්ත්‍රික් මඟින් සැකසු වාර්ථාව 2013.06.15 දිනට පෙර ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම දිස්ත්‍රික් බැංකු විෂය භාර කළමනාකරුගේ වගකීමකි.

4. සමාජ සංවර්ධන හා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන.

මේ යටතේ සැම වසමකම අදාල විහාරස්ථානය කේන්ද්‍ර කොටගෙන සිදු කරන අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සඳහා සමාජ සංවර්ධන නිලධාරින්ගේ සක්‍රිය දායකත්වය ලබාදීමට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමාජ සංවර්ධන අංශය මගින් එකඟත්වය පළ කර ඇත. ඒ අනුව ඔවුන්ගේ දායකත්වය මේ සඳහා ලබාගන්නා ලෙස මහ සංගම්/ මුලස්ථාන කළමනාකරුවන් වෙත උපදෙස් ලබාදෙනු ලැබේ.

5. රාජ්‍ය වෙසක් උත්සවය.

පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරනු ලබන රාජ්‍ය වෙසක් උත්සවයේ රූපවාහිනි සජීවි විකාශය, පිරිකර පූජාව, එදින එම උත්සවය සඳහා සහභාගි වන්නන්ට බුදුසරණ පුවත්පත් 5000 ක පමණ ප්‍රමාණයක් ධර්ම දානය ලෙස බෙදා හැරීම ඇතුළු කටයුතු සඳහා දායකත්වය සැපයීමට සමෘද්ධි අධිකාරිය විසින් අපේක්ෂා කරනු ලැබේ. 2013.05.24,25 වන දින වල මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් යුධගනාව රජමහ විහාරස්ථානයේ දී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිත මෙම වැඩසටහන සඳහා මොරණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අවශ්‍ය උපදෙස් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ලැබේ.

6. මෙම වැඩසටහන සඳහා "බුදුසරණ" පුවත්පත් ඇතුළු එම ආයතනයේ අනිකුත් පුවත්පත් මගින් ප්‍රචාරණයක් ලබාදීමට ලේක්හවුස් ආයතනය විසින් කටයුතු කරනු ඇති අතර ජාතික රූපවාහිනිය මඟින්ද අදාල ප්‍රචාරයන් සිදු කරනු ලැබේ. ඊට අමතරව අපගේ මාධ්‍ය අංශය මගින් ද පුළුල් ප්‍රචාරණයක් මෙම වැඩසටහනට ලබාදෙනු ඇත.

7. ඉහත කරුණු හැර අනිකුත් සියළුම කරුණු සම්බන්ධයෙන් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 20 හා ඊට අදාල උපදෙස් නොවෙනස්ව පවතිනු ඇත.

8. මෙම වැඩසටහන සාර්ථක කරගැනීමට ඔබ සැම දක්වන සහය පිළිබඳව අගය කරමු.

| | |
|---|---|
| ආර්.පී.බී. තිලකසිරි, | කේ.කේ.එල්. චන්ද්‍රතිලක, |
| අධ්‍යක්ෂ ජනරාල්. | නි. අධ්‍යක්ෂ - බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම්. |